සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 02 |

උපදෙස් :
* වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඔබට සපයා ඇති පිළිතුරු වරණ පත්‍රයේ සටහන් කරන්න.

1. නිෂ්පාදන සාධකයක් ලෙස "භූමිය" යන්නෙහි ආර්ථික විද්‍යාත්මක අර්ථය වඩාත් නිවැරදිව පෙන්වා දෙන්නේ පහත සඳහන් කවර වරණයෙන්ද ?
   (1) කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා සෘජුවම යොදා ගනු ලබන සියලුම ස්වාභාවික සම්පත්
   (2) මානව උත්සාහයෙන් ස්වායත්තව පවතින සියලුම ස්වභාදහමේ දායාදයන්
   (3) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා භාවිතා කළ හැකි සියලුම ස්වාභාවික සම්පත්
   (4) වෙළඳපළේ විනිමය අගයක් පවතින සියලුම ස්වාභාවික සම්පත්
   (5) පුද්ගලයන් හෝ රජය සතු සියලුම ස්වභාවික සම්පත්

2. ශ්‍රම විභජනය සහ ආර්ථික කාර්යක්ෂමතාව අතර සම්බන්ධතාවය වඩාත් හොඳින් විස්තර කරනු ලබන්නේ පහත සඳහන් කවර වරණයෙන්ද ?
   (1) ශ්‍රම විභජනය මගින් නිෂ්පාදනය සඳහා අවශ්‍ය සම්පත්වල මුළු ප්‍රමාණය අඩු කරයි
   (2) ශ්‍රම විභජනය මගින් සේවකයින්ට සියලුම නිෂ්පාදන කාර්යයන් වඩාත් ඵලදායි ලෙස කිරීමට ඉඩ සලසයි
   (3) සේවකයින්ට නිශ්චිත කාර්යයන් සඳහා විශේෂීකරණය වීමට ඉඩ සැලසීම මගින් ශ්‍රම විභජනය ඵලදායිතාවය ඉහළ නංවයි
   (4) ශ්‍රම විභජනය මගින් තාක්ෂණික දියුණුවේ අවශ්‍යතාවය නැතිකර දමයි
   (5) ශ්‍රම විභජනය මගින් සියලුම සේවකයින්ට සමාන වැටුප් සහතික කරයි.

3. පහත සඳහන් ඒවායින් නිෂ්පාදන හාකියා වක්‍රයේ විතැන්වීමකට හේතුවක් නොවන්නේ කුමක්ද?
   (1) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (Real GDP) අඛණ්ඩ අඩුවීමක්
   (2) සුළි කුණාටුවක් හේතුවෙන් වාරි පද්ධති විනාශවීම.
   (3) ප්‍රයෝජනයට නොගත් ඉඩම්වල පොල් වගා කිරීම.
   (4) රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම.
   (5) නව ප්‍රතිසංස්කරණ හේතුවෙන් අධ්‍යාපන පද්ධතියේ ඵලදායීතාවය ඉහළ යාම.

4. සමාජ වෙළඳපොළ ආර්ථික ක්‍රමයක රජයේ කාර්යභාරය වඩාත් හොඳින් විස්තර කරන්නේ, පහත සඳහන් කවර වරණයෙන්ද ?
   (1) සියලුම භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සහ බෙදාහැරීම කෙරෙහි සෘජු පාලනයක් ක්‍රියාත්මක කිරීම.
   (2) මිල යාන්ත්‍රණය වෙනුවට පරිපාලනමය සම්පත් වෙන් කිරීම් ආදේශ කිරීම.
   (3) සමාජ ආරක්ෂණය සහ සාධාරණ තරගකාරීත්වය පවත්වා ගනිමින් වෙළඳපළවල් ක්‍රියාත්මක වීමට ඉඩ සැලසීම.
   (4) ව්‍යාපාර වල රජයේ අයිතිය හරහා ආදායම් අසමානතාවයන් තුරන් කිරීම.
   (5) සියලුම කර්මාන්ත සඳහා නිෂ්පාදන ඉලක්ක තීරණය කිරීම.

5. පහත කුමන වරණය, යම් කිසි භාණ්ඩයක මිල වැඩිවූ විට, එම භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය වැඩිවීම සඳහා බල නොපාන්නේ ද,
   (1) සම ජාතීය නොවන නිෂ්පාදන සාධක නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කිරීම.
   (2) කෙටි කාලීන නිෂ්පාදනය ක්‍රියාවලියක ආන්තික නිෂ්පාදනය පහළ බැසීම
   (3) සම්පත් ආදේශන අනුපාතය ඉහළ යාම.
   (4) දෙන ලද කාලසීමාව තුළදී භාණ්ඩ ගබඩා කර අනාගතයේදී ලාභ ලැබීමට ඇති අපේක්ෂාව
   (5) නිෂ්පාදන ආයතන වල ලාභ අපේක්ෂිත චේතනාව

6. යම් කිසි භාණ්ඩයක මිල 30% කින් වෙනස්වන විට එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය A විසින් 20% කින්ද, B විසින් 60% කින්ද වෙනස් කරනු ලබයි නම් , A සහ B ගේ හැසිරීමට හේතුවන්නේ,

(1) සලකා බලන භාණ්ඩයට A ගේ කැමැත්ත B ට වඩා අඩුවීම.
(2) සලකා බලන භාණ්ඩය සඳහා B ට වඩා Aට අඩු ආදේශක සංඛ්‍යාවක් පැවතීම.
(3) සලකා බලන භාණ්ඩය සඳහා A විසින් තම ආදායමින් B ට වඩා වැඩි ප්‍රතිශතයක් වැය කිරීම.
(4) A විසින් සලකා බලන භාණ්ඩයේ මිල අනාගතයේ වැඩි වේ යැයි අපේක්ෂා කරන අතර B විසින් අඩු යැයි අපේක්ෂා කිරීම.
(5) A විසින් සලකා බලන භාණ්ඩය B ට වඩා පටු ලෙස නිර්වචනය කර තිබීම.

7. A භාණ්ඩයේ මිල රු. 32 සිට රුපියල් 40 දක්වා වැඩි වූ B භාණ්ඩයේ ඉල්ලුම ඒකක 160 සිට 140 දක්වා අඩු විය. A හා B භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය සහ එම භාණ්ඩ අතර සබඳතාවය වන්නේ,

(1) - 0.6 සහ ප්‍රතිබද්ධ භාණ්ඩ වේ.
(2) -2 සහ ප්‍රතිබද්ධ භාණ්ඩ වේ.
(3) - 2.5 සහ නම්‍ය භාණ්ඩ වේ.
(4) 0.6 සහ ආදේශක භාණ්ඩ වේ.
(5) 2 සහ ආදේශක භාණ්ඩ වේ.

8. කල්පිත භාණ්ඩයක වෙළඳපොළ සැපයුම් සමීකරණය වන්නේ, QS = -120 + 6 P වේ. මෙම භාණ්ඩය සම්බන්ධයෙන් කුමන ප්‍රකාශය නිවැරදි වන්නේ ද?

(1) මෙම භාණ්ඩයේ මිල වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණය අඩුවේ.
(2) සැපයුම් වක්‍රයේ මිල අක්ෂය මත අන්ත: කණ්ඩය සෘණ අගයකි.
(3) සැපයුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කරන විට මිල සැපයුම් නම්‍යතාවය පහළ බසින අතර 1ට වැඩිවේ.
(4) රු.20 ට වැඩි සෑම මිලකදීම මිල සැපයුම් නම්‍යතාව 1 ට වඩා අඩුවේ.
(5) මෙම භාණ්ඩය කෘෂිකාර්මික හෝ ගොවිපළවල නිපදවන භාණ්ඩයකි.

9. යම් කිසි භාණ්ඩයක සමතුලිත මිල රු. 5/= ක් සහ සමතුලිත ප්‍රමාණය ඒකක 18 ක් වන විට සමතුලිතයේදී නිෂ්පාදන අතිරික්තය 52.50 සහ පාරිභෝගික අතිරික්තය රු. 13.50 ක් වේ. මෙම භාණ්ඩය සඳහා සැපයුම් නම්‍යතාවය අනම්‍ය වන්නේ නම්, පහත කුමන ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ යුගලය නිවැරදි වන්නේද?

(1) Qd = 78 – 6P<br>Qs = 3 + 25P
(2) Qd = 78 – 12p<br>Qs = 3+3P
(3) Qd = 72 – 9p<br>Qs = 3 + 3p
(4) Qd = 78 – 12 p<br>Qs = -3+3p
(5) Qd = 81 – 9p<br>Qs= -9+3P

10. කල්පිත භාණ්ඩයක සැපයුම වැඩිවීම නිසා, වෙළඳපළෙහි සමතුලිත ප්‍රමාණය වැඩි විය. නමුත් නිෂ්පාදකයාගේ අයභාරය අඩු විය. මෙම භාණ්ඩය සඳහා ඉල්ලුම් නම්‍යතාවය,

(1) අනම්‍ය වේ.
(2) ඒකීය නම්‍ය වේ.
(3) පූර්ණ නම්‍ය වේ.
(4) නම්‍ය වේ.
(5) පූර්ණ අනම්‍ය වේ.

11. ඉහළම නිෂ්පාදන අතිරික්තයක් දැකිය හැක්කේ, පහතට බෑවුම්වන සාමාන්‍ය ඉල්ලුම් වක්‍රයක් සමඟ පහත කුමන සැපයුම් වක්‍රය සංයෝග වූ විට ද?

(1) පූර්ණ නම්‍ය සැපයුම් වක්‍රයක්
(2) සාපේක්ෂ නම්‍ය සැපයුම් වක්‍රයක්
(3) ඒකීය නම්‍ය සැපයුම් වක්‍රයක්
(4) සාපේක්ෂ අනම්‍ය සැපයුම් වක්‍රයක්
(5) පූර්ණ අනම්‍ය සැපයුම් වක්‍රයක්.

12. රජය ඉන්ධනය වෙළඳ පොළෙහි ඉල්ලුම පාලනය කිරීම සඳහා QR ක්‍රමය හඳුන්වා දෙන ලදී. එහි ප්‍රතිඵලයක් නොවන්නේ,

(1) අධි ඉල්ලුමක් පැවතීමයි.
(2) කළු කඩ වෙළෙඳ පොලක් ඇතිවීමයි.
(3) පෝලිම් බිහිවීමයි.
(4) සමාජ සුභසාධනය ඉහළයාමයි.
(5) පරිපාලන වියදම් ඉහළ යාම.

13. රජය විසින් රාජ්‍ය ආදායම ඉහළ දැමීමත් ආර්ථික සුභ සාධනය උපරිම කිරීමත් අරමුණු කරගෙන වක්‍ර බද්දක් පනවන ලදී. මෙම අරමුණු දෙකම සපුරා ගැනීමට හැකිවන වෙළඳ පොළ තත්ත්වය වන්නේ,

(1) පූර්ණය නම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.
(2) පූර්ණ අනම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.
(3) ඒකීය නම්‍ය ඉල්ලුමක් සහ ඒකීය නම්‍ය සැපයුමක් පැවතීමයි.
(4) නම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.
(5) අනම්‍ය ඉල්ලුමක් සහා අනම්‍ය සැපයුමක් පැවතීමයි.

14. තරගකාරී වෙළඳපළක අලෙවිවන කල්පිත භාණ්ඩයක් සඳහා ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත පරිදි වේ.

$Qd = 240 - 12P$ $Qs = 96$ ඒකක.

රජය වෙළඳපළ මිල රු. 4 කින් අඩු කිරීම සඳහා මෙම වෙළඳපළට මැදිහත් වන්නේ නම් පහත කුමන ප්‍රකාශය නිවැරදි නොවන්නේද?

(1) නිෂ්පාදන අතිරික්තය රු. 384 කින් අඩුවේ.
(2) ආර්ථික සුභසාධනය අඩුවේ.
(3) පාරිභෝගික අතිරික්තය රු. 384 කින් ඉහළ යාම.
(4) රජය ඒකක 48 ක් ආනයනය කළ යුතුයි.
(5) ඒකක 48කින් අධි ඉල්ලුමක් හට ගැනීම.

15. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක "හීනවන ආන්තික ඵලදා නීතිය" ක්‍රියාත්මක වීමට පටන් ගන්නේ,
(1) මුළු නිෂ්පාදිතය (TP)අඩුවීමට පටන් ගන්නා විට.
(2) ආන්තික නිෂ්පාදිතය (MP) සෘණ අගයක් ගන්නා විට.
(3) ආන්තික නිෂ්පාදිතය (MP)දන අගයකින් පවතිමින් අඩුවීමට පටන් ගන්නා විට
(4) සාමාන්‍ය නිෂ්පාදිතය (AP) එහි උපරිමයට පැමිණෙන විට.
(5) ආන්තික නිෂ්පාදනය(MP) ශූන්‍ය වන විට.

16. කෙටි කාලීනව ආන්තික පිරිවැය (MC) සාමාන්‍ය මුළු පිරිවැයට(ATC) වඩා අඩු වන විට සිදුවිය යුත්තේ කුමක්ද ?
(1) සාමාන්‍ය මුළු පිරිවැය අඩුවන වේගයකින් ඉහළ යා යුතුය.
(2) සාමාන්‍ය මුළු පිරිවැය අනිවාර්යයෙන්ම පහළ යා යුතුය.
(3) සාමාන්‍ය මුළුපිරිවැය ස්ථාවරව පැවතිය යුතුය.
(4) සාමාන්‍ය මුළු පිරිවැය ඉහළ යා යුතුය.
(5) සාමාන්‍ය මුළු පිරිවැය එහි අවම මට්ටමේ තිබිය යුතුය.

17. ආයතනයක් වතුර බෝතල් 200 ක් නිෂ්පාදනය කරයි. 200 වන වතුර බෝතලයේ ආන්තික පිරිවැය (MC) රු.50කි. 200 වන වතුර බෝතලය නිෂ්පාදනය කිරීමට පෙර සාමාන්‍ය මුළු පිරිවැය (ATC) රු. 48 කි. 200 වන වතුර බෝතලය නිෂ්පාදනය කිරීමේ දී නව සාමාන්‍ය මුළු පිරිවැය (ATC) කොපමණද?

(1) රු. 48.10
(2) රු. 48.25
(3) රු. 48.50
(4) රු. 48.15
(5) රු. 48.01

18. කතිපයාධිකාරී වෙළඳ පොළක ආයතන අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතින්නේ මන්ද යත්,

(1) එක් එක් ආයතනයේ ක්‍රියාමාර්ග වෙළඳපොළ මිලට සහ තරඟකරුවන්ගේ ලාභයට බලපාන බැවිනි.
(2) ආයතන සමජාතීය නිෂ්පාදන නිපදවන අතර ප්‍රතිවාදීන් නොසළකා හරින බැවිනි.
(3) පූර්ණ නම්‍ය ඉල්ලුමකට මුහුණ දෙන බැවිනි.
(4) මිල සැම විටම ආන්තික පිරිවැය මගින් තීරණය වන බැවිනි.
(5) ආයතන කිසිවිටෙකත් එකිනෙකා සමග තරග නොකරන බැවිනි.

19. වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ඇතුළත් කෙරෙන අයිතමය වන්නේ,
(1) අස්වැසුම වැනි සංක්‍රාම ගෙවීම්
(2) නිෂ්පාදනයේදී යොදාගත් අතර මැදි යෙදවුම්
(3) යටිතල පහසුකම් සඳහා රජය විසින් දරන වියදම්
(4) පාවිච්චි කළ මෝටර් රථ අලෙවිය
(5) ශ්‍රී ලාංකිකයන් විසින් විදේශ ගතව ලබන අදායම

20. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය පහත කුමන කරුණක් මඟින් වර්ධනය කරයිද?

(1) විරැකියාව සඳහා සහනාධාර ඉහළ යාම.
(2) පාරිභෝගික භාණ්ඩ ආනයනය
(3) තේ අපනයනය ඉහළ යාම
(4) කොටස් වෙළඳපොලේ කොටස් විකිණීම
(5) විශ්‍රාමිකයන්ට ගෙවන විශ්‍රාම වැටුප් ඉහළ යාම.

21. එක්තරා ආර්ථිකයක මුලු සම්පත් රු. 72 000 කි. ආයෝජනය රු. 48 000 සහ සාධක නොවන අපනයන වටිනාකම රු. 7 500ක් වන්නේ නම්, මුළු පරිභෝජන වටිනාකම වන්නේ,

(1) රු. 55 000 (2) රු. 27 000 (3) රු. 16 500
(4) රු. 24 000 (5) රු. 14 000

22. 2024 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට සේවා අංශයේ දායකත්වය වන්නේ,

(1) 60.7 % (2) 59.2 % (3) 55.9 %
(4) 62.5 % (5) 51.5 %

23. රජයේ මැදිහත්වීම සහිත ආවෘත ආර්ථිකයකට අදාළ දත්ත පහත දක්වා ඇත.

ඉතුරුම් ශ්‍රිතය S = - 500+0.2 Yd  බදු T = රු. 100
ආයෝජන I = රු.මි. 100  රාජ්‍ය වියදම G = රු. මි. 250

මෙම ආර්ථිකයේ සමතුලිත නිමැවුම හා එම නිමැවුමේදී පරිභෝජන වියදම වන්නේ,

(1) Y = 3 850 , C = 3 500 (2) Y = 1 800 , C = 1 350
(3) Y = 3 100 , C = 2 750 (4) Y = 6 600 , C = 1 300
(5) Y = 2 200 , C = 1 650

24. සාර්ව ආර්ථිකයක යම් දෙන ලද අවසථාවක පාරිභෝජන ශ්‍රිතයේ ඉහළට සමාන්තර විතැන්වීමක් දැකිය හැක්කේ පහත කිනම් අවස්ථාවේ දී ද?

(1) රජය විසින් අයකළ ස්වාධීන බදු අඩු කිරීම.
(2) ආන්තික ඉතුරුම් නැම්යාව ඉහළ යාම.
(3) කුටුම්භ වෙත ලබා දෙන සංක්‍රාම වල පහළ යාම.
(4) ආදායම් බදු ප්‍රතිශතයේ ඉහළ යාම.
(5) ආන්තික පරිභෝජන නැම්යාව ඉහළ යාම.

25. යම් ආර්ථිකයක ආන්තික පරිභෝජන නැම්යාව 0.8 වේ. රජය විසින් මෙම ආර්ථිකයට රු.මි. 50 ක ස්වාධීන බද්ධක් පැනවූ විට බදු ගුණකය හා ජාතික නිමැවුමේ වෙනස (ΔY) නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

(1) බදු ගුණකය = - 4 , ΔY = රු.මි. – 200 (2) බදු ගුණකය = - 5 , ΔY = රු.මි. - 250
(3) බදු ගුණකය = - 4 , ΔY = රු.මි. – 250 (4) බදු ගුණකය = - 5 , ΔY = රු.මි. - 200
(5) බදු ගුණකය = - 3 , ΔY = රු.මි. – 150

26. ඉහළ උද්දමනයක් සහිත ආර්ථිකයක මහජනයා ඉතිරි කිරීමේ අරමුණ සඳහා විදේශ මුදල් භාවිතය ආරම්භ කලද ඒදිනෙදා ගනුදෙනු සඳහා දේශීය මුදල් භාවිත කරයි. පහත සඳහන් මුදලේ කාර්යයන් අතුරින් මූලික වශයෙන් දුර්වල වන්නේ,

(1) හුවමාරු මාධ්‍යයක් වීම. (2) වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම.
(3) ගිණුම් ඒකකයක් වීම. (4) විලම්භිත ගෙවීම් ක්‍රමයක් වීම.
(5) හුවමාරු මාධ්‍යයක් හා ගිණුම් ඒකකයක් ලෙස ක්‍රියාකිරීම යන දෙකම.

27. මෑත කාලීන මූල්‍ය දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ පුළුල් මුදල් සැපයුම (M2) වර්ධනය මඟින් පෙන්නුම් කරන වඩාත් හොඳම ආර්ථික ඇඟවීම වනුයේ, පහත සඳහන් කවරක්ද ?

(1) අධික ද්‍රවශීලතාවය හේතුවෙන් ආර්ථිකය උද්ධමනකාරී තත්වයකට ලක්වීමට ඉඩ ඇත.
(2) උද්දමන පීඩනය පාලනය වී තිබීමට හෝ ස්ථාවරව තිබීමට ඉඩ ඇත.
(3) අපනයන දිරිගැන්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දැඩි ලෙස මුදල් අච්චු ගසමින් සිටියි.
(4) විනිමය අනුපාතය වේගයෙන් වැඩි දියුණු වේ.
(5) මෙහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය හිඟය ස්වයංක්‍රීයව පුළුල් විය යුතුය.

28. යම් ආර්ථිකයක් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු.බි. 5000 කි. පදනම් වර්ෂයේ මිල දර්ශකය 100 ක් වන අතර පවත්නා වර්ෂයේ මිල දර්ශකය 160කි. පටු මුදල් සැපයුම (M1) රු. 2000ක් වන්නේ නම්,මුදල් සංසරණ ප්‍රවේගය (V) ගණනය කළ විට

(1) 2.0 (2) 2.5 (3) 3.0 (4) 3.5 (5) 4.0

29. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් වන බැංකු ක්‍රමයකට රු. 100 000 ක මුදල් තැන්පතුවක් පැමිණි විට බැංකු ක්‍රමය මඟින් අධි සංචිත පවත්වා නොගන්නේ නම් සහ සියලු ණය ලබා ගන්නන් එම බැංකු ක්‍රමයේම තැන්පත් කරන්නේ නම් එම බැංකු ක්‍රමයට නිර්මාණය කළ හැකි උපරිම ණය ප්‍රමාණය වන්නේ,

(1) රු. 100 000 (2) රු. 900 000 (3) රු. 1 000 000
(4) රු. 810 000 (5) රු. 90 000

30. ආර්ථිකයක් තුළ පහත සඳහන් සිදුවීම් එකවර සිදු වේ.

A රජය බැංකු ණය මඟින් මූල්‍යනය කරනු ලබන රජයේ ආයෝජන ඉහළ නංවයි.
B ජාත්‍යන්තර තෙල් මිල සීඝ්‍රයෙන් ඉහළ යයි.
C විරැකියාව ස්වාභාවික විරැකියා අනුපාතයට වඩා පහළ බසී.
D වෘත්තීය සමිති ඉහළ නාමික වැටුප් ලබා ගැනීමට සාකච්ඡා කරයි.

ඉල්ලුමෙන් ඇදුණු උද්දමනය සහ පිරිවැයෙන් තල්ලු වුන උද්දමනය සඳහා මූලික හේතු නිවැරදිව හඳුනා ගන්නා සංයෝගය කුමක්ද?

| | ඉල්ලුමෙන් ඇදුණු උද්දමනය | පිරිවැයෙන් තල්ලුවුන |
|---|---|---|
| 1. | A සහ B | C සහ D |
| 2. | A සහ C | B සහ D |
| 3. | C පමණි | B පමණි |
| 4. | A, B සහ C | D පමණි |
| 5. | A, B, C, D | - |

31. අවගුණ භාණ්ඩ සම්බන්ධයෙන් වෙළඳ පොළ අසමත්වීම වඩාත් හොඳින් පැහැදිලි කරන්නේ පහත සඳහන් කවරක් මඟින්ද?

(1) ආන්තික සමාජ ප්‍රතිලාභ, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභයට වඩා වැඩිය. ( MSB > MPB )
(2) ආන්තික පෞද්ගලික පිරිවැය, ආන්තික සමාජ පිරිවැයට වඩා වැඩිය. ( MPC > MSC )
(3) ආන්තික සමාජ පිරිවැය, ආන්තික පෞද්ගලික පිරිවැයට වඩා වැඩිය. ( MSC > MPC )
(4) ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ, ආන්තික සමාජ ප්‍රතිලාභයට වඩා වැඩිය. ( MPB > MSB )
(5) ආන්තික සමාජ ප්‍රතිලාභ, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ වලට සමාන වේ. ( MSB = MPB )

32. රජයෙන් නව බදු ප්‍රතිපත්තියක් ඇගයීමට ලක් කරමින් සිටි. යෝජිත බදු එකතු කිරීම පහසු මෙන් අඩු පිරිවැයක් සහිත වේ. සම්පත් වෙන් කිරීමේදී සිදුවන විකෘතිතාවය අවම කරයි සහ බදු ගෙවන්නාගේ ගෙවීමේ හැකියාව අනුව පනවනු ලැබේ. මෙම යෝජනාව මගින් තෘප්තිමත් වන්නේ යහපත් බද්දක කුමන ලක්ෂණයක්ද ?

(1) සාධාරණත්වය, නිශ්චිතභාවය සහ පහසුව.
(2) පිරිමැසුම් බව, මධ්‍යස්ථභාවය සහ සාධාරණත්වය.
(3) නිශ්චිතභාවය, සාධාරණත්වය සහ පහසුව.
(4) පිරිමැසුම් බව, නිශ්චිතභාවය සහ මධ්‍යස්ථ බව.
(5) නිශ්චිතබව

33. රජයේ සමහර වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස හැඳින්වෙන්නේ, ඒවා

(1) රජයේ එදිනෙදා පරිපාලන කටයුතු ඉලක්ක කර ඇති නිසාය.
(2) දිගු කාලයක් පුරා ප්‍රතිලාභ ලබා දෙන වත්කම් නිර්මාණය කිරීමට හේතුවන නිසාය.
(3) එකම මූල්‍ය වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම පරිභෝජණය කරන නිසාය.
(4) මූලික වශයෙන් වැටුප් සහ විශ්‍රාම වැටුප් ගෙවීමට යොදා ගන්නා නිසාය.
(5) කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව සංක්‍රාම ගෙවීමක් නිසාය.


34. රජය විසින් බදු පනවනු ලබන විට, ආර්ථිකය තුල සම්පත් වැරදි ලෙස වෙන් කිරීම හේතුවෙන් ආර්ථික අකාර්යක්ෂමතාවක් ඇති වේ. මෙය හඳුන්වනු ලබන්නේ,

(1) ආර්ථික බදු ආපාතය.
(2) බදුකරණයේ මධ්‍යස්ථ බව.
(3) අධි බදු බර.
(4) බදු අනුකූලතාවයේ හිඟකම.
(5) බද්ද පසුපසට විතැන්වීම.

35. ඉතා ඉහළ තත්වයක පැවති රාජ්‍ය මූල්‍ය හිඟය ක්‍රමයෙන් අඩුවන තත්වයක් පසුගිය වර්ෂවල ශ්‍රී ලංකාවේ දක්නට ලැබිණි. මෙහි ප්‍රතිවිපාකයක් නොවන්නේ,

(1) පොළී අනුපාතය අඩු වීම.
(2) පෞද්ගලික ආයෝජන අඩු වීම.
(3) රාජ්‍ය ණය ගැනීම වැඩි වීම.
(4) ප්‍රාථමික ගිනුමේ ශේෂය වැඩි දියුණු වීම.
(5) රාජ්‍ය ණය අඩු වීම.

36. A සහ B රටවල් යෙදවුම් ඒකකයකින් නිපදවන ආහාර හා රෙදි ප්‍රමාණයන් පහත නිෂ්පාදන හැකියා මායිම මගින් දැක්වේ.




මෙම රටවල් දෙක අතර වඩා වාසිදායක හුවමාරුවක් සිදුවී පැවතිය යුතු තත්ත්වය වන්නේ,

(1) 1 C = 0.6 F
(2) 1 C = 0.5 F
(3) 1 C = 0.7 F
(4) 1 C = 1.5 F
(5) 1 C = 0.3 F

37. යම් භාණ්ඩයක් ආනයනය කිරීමට රු. 600 ක් වැය වේ. මේ සඳහා ආනයනික යෙදවුම් වල අගය රු. 300 ක් වන අතර නිමි භාණ්ඩ සහ ආනයනික යෙදවුම් යන දෙකම මත පනවා ඇති තීරු බදු අනුපාතිකය 10% නම් සඵල ආරක්ෂණ අනුපාතිකය කොපමණද?

(1) 5 % (2) 10 % (3) 20 % (4) 25 % (5) 50 %

38. පහත සඳහන් ආර්ථික ඒකාබද්ධතා අතරින්, සාමාජික රටවල් අතර නිදහස් වෙළදාමක් පවතින මෙන්ම පොදු තීරු බදු ක්‍රමයක් පවතිනුයේ කවරකද ?

(1) වරණීය වෙළඳ ගිවිසුම (PTA)
(2) නිදහස් වෙළඳ කලාප (FTA)
(3) තීරු බදු සංගමය (CU)
(4) පොදු වෙළඳ පොළ (CM)
(5) ආර්ථික සංගමය (EU)

39. පහත සඳහන් දෑ අතුරින් රටක භාණ්ඩ වෙළඳ අනුපාතය වැඩි දියුණු වීමට හේතු වන්නේ,

(1) උද්දමනය.
(2) ශ්‍රම ඵලදායිතාවයේ දියුණුව.
(3) ආනයනික භාන්ඩවල මිල ඉහළ යාම.
(4) දේශීය මුදලේ අගය ප්‍රතිප්‍රමාණය වීම.
(5) සැපයුම් දාම බිඳ වැටීම හේතුවෙන් අමු ද්‍රව්‍ය මිල ඉහළ යාම.

40. රටක ගෙවුම් ශේෂ දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලු දත්ත ඇ.ඩො. බිලියන)

ජංගම ගිණුමේ ශේෂය - 200

ප්‍රාග්ධන ගිණුමේ ශේෂය - 75

පහත පිළිතුරු අතරින් වැරදීම් හා අත් හැරීම් සහ මූල්‍ය ගිනුමේ ශේෂය පිලිබඳ නිවැරදි වන්නේ,

| | වරදීම් හා අත්හැරීම් | මූල්‍ය ගිණුමේ ශේෂය |
|---|---|---|
| (1) | - 125 | 125 |
| (2) | - 75 | - 200 |
| (3) | - 25 | - 100 |
| (4) | - 25 | + 150 |
| (5) | 40 | + 160 |

41. ඇමරිකානු ඩොලැයක අගය රු. 280 කි. ශ්‍රී ලංකා රුපියල 30% කින් අවප්‍රමාණය වේ නම්, අවප්‍රමාණයෙන් පසු ඇමරිකානු ඩොලරයක අගය කොපමණද ?

(1) රු. 364 (2) රු. 2015 (3) රු. 400
(4) රු. 410 (5) රු. 150

42. ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත වලට අනුව, 2025 වර්ෂය අවසානයේ ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය කොපමණද?

(1) ඇමරිකානු ඩොලර් බිලියන 7.8 (2) ඇමරිකානු ඩොලර් බිලියන 6.8
(3) ඇමරිකානු ඩොලර් බිලියන 6·1 (4) ඇමරිකානු ඩොලර් බිලියන 7.3
(5) ඇමරිකානු ඩොලර් බිලියන 5.2

43. සර්ව සහභාගී ආර්ථික සංවර්ධනයක් සඳහා ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට ගත හැකි වඩාත් කාර්යක්ෂම උපාය මාර්ගය වන්නේ,

(1) අපනයනාභිමුඛ කාර්මික සංවර්ධනය සඳහා මූලිකත්වය ගැනීම.
(2) මානව ප්‍රාග්ධනය, ග්‍රාමීය සංවර්ධනය හා කුඩා ව්‍යවසායකයන් සඳහා ආයෝජනය.
(3) නාගරික සුඛෝපභෝගී පරිභෝජනය වැඩි කිරීම.
(4) අධ්‍යාපනය හා සෞඛ්‍යය සඳහා වන රජයේ වියදම් අඩු කිරීම.
(5) කෙටි කාලීන ව්‍යාපෘති සඳහා ප්‍රධාන වශයෙන් විදේශ ණය ගැනීම් මත රඳා පැවතීම.

44. සංවර්ධනය මිනුම් කිරීම සඳහා භාවිතා වන ආංශික දර්ශකයක් වන්නේ,

(1) ඒක පුද්ගල ආදායම. (2) මානව සංවර්ධන දර්ශකය.
(3) සතුටු දර්ශකය. (4) සෞභාග්‍යතා දර්ශකය.
(5) බහුමාන දරිද්‍රතා දර්ශකය.

45. 2026 වර්ෂයේ ලෝක සතුටු දර්ශකය අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම වන්නේ,

(1) 138 (2) 128 (3) 134 (4) 183 (5) 120

46. ආර්ථිකයක ගිනි සංගුණකය වැඩි කරන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

(1) ධනවත් පංතියේ ආදායම දුගී ජනතාව අතර නැවත බෙදා හැරීම.
(2) සමාජ සුභ සාධන සංක්‍රාම ඉහළ නැංවීම.
(3) අඩු ආදායම්ලාභී කුටුම්භ අංශයට වඩා ඉහළ ආදායම්ලාභී කුටුම්භ අංශයේ වේගවත් ආර්ථික වර්ධනය.
(4) නොමිලේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සඳහා විශ්වීය ප්‍රවේශය.
(5) අනුක්‍රමික බදු ක්‍රමයක් නිර්මාණය කිරීම.

47. ජනගහණ දරිද්‍රතා දර්ශකය සහ ජාතික දරිද්‍රතා ඉම අතර වෙනස සඳහන් වරණය වන්නේ,

(1) ජනගහන දරිද්‍රතා දර්ශකය මගින් ආදායම් සීමාව මනිනු ලබන අතර ජාතික දරිද්‍රතා ඉම මගින් එම සීමාවට පහළ ජන කොටස නිරූපනය කෙරේ.

(2) ජනගහන දරිද්‍රතා දර්ශකය මගින් දරිද්‍රතා ඉමට පහළින් සිටින ජනගහනයේ අනුපාතය මනින අතර ජාතික දරිද්‍රතා ඉම මගින් මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය අවම ආදායම නිර්වචනය කෙරේ.

(3) ජනගහන දරිද්‍රතා දර්ශකය සහ දරිද්‍රතා ඉම යන ආකාර දෙකම ආදායම් අසමානතාවය මන්නු ලබයි.

(4) ජාතික දරුද්‍රතා ඉම, ජනගහන දරිද්‍රතා දර්ශකය සමඟ වෙනස් වන අතර, ජනගහන දරිද්‍රතා දර්ශකය ස්ථාවරව පවතී.

(5) ජනගහන දරිද්‍රතා දර්ශකය තුළ ආදායම් නොවන සාධක අන්තර්ගත වන අතර ජාතික දරුද්‍රතා ඉම තුළ ආදායම පමණක් අන්තර්ගත වේ.

48. ශ්‍රී ලංකා රජය විසින් 2026 වර්ෂයේ ආරම්භ කරන ලද "ප්‍රජාශක්ති" වැඩ සටහනේ ප්‍රධාන අරමුණ වන්නේ,

(1) ග්‍රාමීය සහ වතු වගාවන් බල ගන්වන සාදාරණ ආර්ථික ව්‍යෘපෘතියක් සහතික කරන සහ සමාජ ආරක්ෂාව ශක්තිමක් කරන ප්‍රජා මූලික ජනතා කේන්ද්‍රීය ප්‍රවේශයන් හරහා දරිද්‍රතාව තුරන් කිරීම.

(2) රටපුරා රජයේ සියලුම පාසල්වල ඩිජිටල් තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම.

(3) ග්‍රාමීය දරිද්‍රතාව තුරන් කිරීම සහ ආරථික ප්‍රතිලාභ සාදාරණ ලෙස බෙදා හැරීම සඳහා රාජ්‍ය යන්ත්‍රණයක් ඒකාබද්ධ කිරීම සහ ප්‍රජාවන් බල ගැන්වීම.

(4) ආර්ථික වර්ධනය සඳහා රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම සහ ආර්ථික වර්ධනයේ ක්‍රියාවලියට සහායවීම සඳහා නාගරික දුප්පත් අංශයට සහායවීම.

(5) වඩාත්ම සුදුසු දුප්පත්ම සහ අවධානමට ලක්විය හැකි පවුල් සඳහා ඉලක්කගත විනිවිද පෙනෙන සහ තාවකාලික මූලිකාධාර සැපයීම.

49. නැවත වතාවක් ආර්ථික පරිහානියකට ලක් නොවීම සඳහා ශ්‍රී ලංකාව විසින් පහත කුමන පියවර අනුගමනය නොකල යුතුද?

(1) අය - වැය හිඟය අඩු කිරීම මගින් රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කිරීම.

(2) අපනයන විවිධාංගීකරණය ධෛර්යමත් කිරීම සහ විදේශ විනිමය ඉපයීම් වැඩි කිරීම.

(3) දිගු කාලීනව කෘතිම පාලිත විනිමය අනුපාතයක් පවත්වාගෙන යාම.

(4) කාර්යක්ෂම බදු පරිපාලනයක් තුලින් රාජ්‍ය බදු ආදායම ඉහළ නැංවීම.

(5) ඍජු විදේශ ආයෝජණ ඉහළ නැංවීම.

50. වර්තමාන ආර්ථික තත්වය හමුවේ ශ්‍රී ලංකාවේ ආදයම් බෙදී යාමේ විෂමතාවය සහ දරිද්‍රතාවය අඩු කිරීම සඳහා අවම දුයකත්වයක් සපයන ප්‍රතිපත්තිමය යෝජනා වන්නේ,

(1) දරිද්‍රතා අවදානමට ලක්විය හැකි කුටුම්භ දක්වා අස්වැසුම සුභ සාධන වැඩ සටහන ව්‍යාප්ත කිරීම.

(2) ප්‍රාදේශීය අසමතුලිතතාවය අඩු කිරීම සඳහා ඩිජිටල් සබඳතාවල සහ ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට ආයෝජනය කිරීම.

(3) ආදායම් මට්ටම නොසලකා ඉන්ධන හා විදුලිබලය මත සියලු දෙනාට සාධාරණ සහනාධාරයක් ලබා දීම.

(4) අඩු ආදායම් ලාභී කණ්ඩායම් සඳහා ගුණත්වයෙන් යුතු අධ්‍යාපනයට හා වෘත්තීය පුහුණු වැඩසටහන්වලට ප්‍රවේශ වැඩි කිරීම.

(5) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සංවර්ධනය හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් හරහා සර්ව සහභාගීත්ව සංවර්ධනය ධෛර්මත් කිරීම.